ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2002 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2002 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ ඔක්තෝබර් මස 04 වන දින.]

එල්. ඩී.—ඕ. 17/2002.

**සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 495 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :- 101 වන අධිකාරයේ 495 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සම විත්තිකරු පත් කළ හැකි බව.

495. බාලවයස්කරුගේ සම්බන්ධතාවට ප්‍රතිවිරුද්ධ සම්බන්ධතාවක් නැත්තේ නම්, හොඳ සිහියෙන් යුත්, වයස් පිරුණු සම විත්තිකරුවකු නඩුවෙහි භාරකරු වශයෙන් පත් කළ හැකි නමුත්, පැමිණිලිකරුවකු එසේ පත් කළ නොහැකි ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 544 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 544 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) 1982 අංක 17 දරන සමාගම් පනත ප්‍රකාරව ලියාපදිංචි කරනු ලැබූ හෝ තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ සමාගමක යම් කොටසක් ; හෝ"; සහ

(2) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

"මේ වගන්තියේ කාර්ය සඳහා "කොටස" යන්නට 1982 අංක 17 දරන සමාගම් පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය."

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

2—H 016433—4,400 (2002/07)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.